Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 09 - 2023**

# ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

## I කොටස

**උපදෙස්:-**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ලන්දේසින්ගේ පෙරදිග පාලන මධ්‍යස්ථානය පිහිටි දූපත කුමක් ද?
   i. බතාවිය ii. සුමාත්‍රා iii. ජාවා iv. පිලිපීනය

2. "කුණ්ඩසාලේ කුමාරයා" නමින් ප්‍රකටව සිටි උඩරට පාලකයා වන්නේ,
   i. දෙවන විමලධර්මසූරිය රජුය ii. දෙවන රාජසිංහ රජුය
   iii. පළමු විමලධර්මසූරිය රජුය iv. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය

3. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වූයේ,
   i. ක්‍රි.ව. 1796 වසරේදී ය. ii. ක්‍රි.ව. 1798 වසරේදී ය. iii. ක්‍රි.ව. 1802 වසරේදී ය. iv. ක්‍රි.ව. 1815 වසරේදී ය.

4. ශ්‍රී ලංකාවේ පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූයේ කවුරුන් ද?
   i. ෆෙඩ්රික් නෝර්ත් ii. තෝමස් මේට්ලන්ඩ් iii. රොබට් බ්‍රවුන්රිග් iv. මැක්ඩෝවල්

5. ලන්දේසින්ගේ වෙළෙඳ අංශය භාරව සිටි ජ්‍යෙෂ්ඨ වෙළෙන්දා හඳුන්වනු ලබන්නේ,
   i. කොමදෝරු නමිනි. ii. ඔපර්හුෆ්ට් නමිනි. iii. විදානේ නමිනි. iv. හුෆ්ට්මන් නමිනි.

- **අංක 6 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.**

6. වතු වගාව සඳහා අවශ්‍ය ඉඩම් ලබාගැනීමට ඉංග්‍රීසින් විසින් ක්‍රි.ව 1840 වර්ෂයේ දී ......................................................පනත හඳුන්වාදෙන ලදි.
7. ක්‍රි.ව 1795 වර්ෂයේ දී ඉංග්‍රීසි ජාතික ...................................................... උඩරටට පැමිණ රාජාධිරාජසිංහ රජු මුණගැසුනි.
8. ඉංග්‍රීසි පාලන සමයේ දී ...................................................... විසින් ගම්පොළ සිංහපිටියේ කෝපි වත්තක් ආරම්භ කරන ලදි.
9. ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනරුද සමයේ දී පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමියන්ගේ මූලිකත්වයෙන් රත්මලානේ ...................................................... පිරිවෙන ආරම්භ කරන ලදි.
10. ඉන්දීය නිදහස් සටනේ පුරෝගාමියෙකු වූ ...................................................... මහතා සම්භාවනීය මහල්ලා යන අන්වර්ථ නාමයෙන් ද හඳුන්වයි.

(පරමධම්මචේතිය / දඩාභායි නඖරෝජි / මහත්මා ගාන්ධි / ඉඩම් / ජෝන් පයිබස් / මුඩුබිම් / ජේම්ස් ටේලර් / විද්‍යෝදය / ජෝර්ජ් බර්ඩ් / රොබට් ඇන්ඩෘස්)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසුව එතුමාගේ සහෝදරයා වූ විජය රාජසිංහ උඩරට රජ බවට පත්විය. ( )

12. ලන්දේසීන් විසින් යෝධ වැව, කන්තලේ වැව ආදී වැව් ප්‍රතිසංස්කරණය කොට ලංකාවේ වී වගාව දියුණු කිරීමට පියවර ගන්නා ලදි. ( )

13. ශ්‍රී වික්‍රමරාජසිංහ රජතුමා විසින් පරණාතල හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා කිහිප නමකට රාජ ද්‍රෝහි චෝදනා එල්ල කොට මරණීය දණ්ඩනය පනවන ලදි. ( )

14. හෙමලියා වෙස්ටර්ට්‍රික්ස් නම් දිලීර රෝගය වැළදීම නිසා ලංකාවේ තේ වගාව විනාශයට පත්විය. ( )

15. ඇම්. සී. සිද්දිලෙබ්බේ මහතාගේ මූලිකත්වයෙන් යාපනයේ ශිවංගල විද්‍යාලය ආරම්භ කරන ලදි. ( )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

16. පෘතුගීසින් විසින් ආසියාවෙන් ගෙනගිය වෙළෙඳ ද්‍රව්‍ය ..................................................... වරායෙන් මිල දී ගත් ලන්දේසින්, ඒවා යුරෝපා ජාතීන්ට විකිණීමේ වෙළෙඳ ව්‍යාපාරයක් ගෙන යන ලදි.

17. ශ්‍රී ලංකාවේ බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ පුරෝගාමියෙකු වූ, ........................................................ විසින් අනුරාධපුරයේ නටබුන්ව ගිය බෞද්ධ පූජනීය ස්ථාන ආරක්ෂාකර ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

18. ඉංග්‍රීසින් විසින් ඊජිප්තුවෙන් පිටුවහල් කරන ලද ........................................................ මහතා ලංකාවේ ඉස්ලාම් ආගමික පුනරුදය වෙනුවෙන් මහඟු සේවයක් සිදුකරන ලද පුද්ගලයෙකි.

19. රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේ දී ........................................................ මහතා විසින් ලංකාවේ වියළි කලාපයේ ගොවිජනපද පිහිටුවීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

20. මූගල් පාලකයෙකු වූ ........................................................ විසින් ටජ්මහල් නම් සුප්‍රකට නිර්මාණය ඉදිකරන ලදි.

(ලකුණු 2**x**20=40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

**උපදෙස්:-**

- **පළමු ප්‍රශ්නය සඳහා අනිවාර්යයෙන් පිළිතුරු ලිවිය යුතුය.**
- **දෙවන කොටසෙන් ඔබ තෝරාගත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.**

### I කොටස (අනිවාර්යය ප්‍රශ්නය)

**1.**(i) **A** ඡායාරූපයෙන් දැක්වෙන්නේ ලංකාවේ පාලකයෙක්, ලංකාවට පැමිණි යුරෝපා ජාතිකයකු මුණගැසුනු අවස්ථාවකි. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A




1. **A** පින්තූරයෙන් දැක්වෙන ලාංකික පාලකයා කවුරුන් ද?
2. ඔහු කුමන රාජධානියක පාලකයෙක් ද?
3. පින්තූරයෙන් දැක්වෙන යුරෝපා ජාතිකයා කවුරුන් ද?
4. ඔහු කුමන ජාතියකට අයත් පුද්ගලයෙක් ද? (ලකුණු 04 යි)


(ii) 1. **B** පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

2. එතුමා කුමන රටක සිට ලංකාවට පැමිණියේ ද?
3. එතුමා පාසල් පිහිටුවීමට අරමුදල් රැස් කිරීම සඳහා පිහිටුවා ගන්නා ලද සංවිධානය කුමක් ද?
4. එතුමාගේ මූලිකත්වයෙන් ලංකාවේ ආරම්භ කළ බෞද්ධ පාසලක් නම් කරන්න. (ලකුණු 4යි)

B




★ **සපයා ඇති ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(iii)1. ලන්දේසි ජාතික ''ජොරිස් වැන් ස්පිල්බර්ජන්'' ලංකාවට ගොඩබට වරාය **B** අක්ෂරයෙන් දැක්වේ. එය හඳුනාගෙන නම් කරන්න.

2. මෙහි දෙවන රාජසිංහ රජුගේ පාලන මධ්‍යස්ථානය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 4යි)

★ **සපයා ඇති ඉන්දියා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(iv)1. පෘතුගාලයේ කැතරින් කුමරිය, එංගලන්තයේ චාල්ස් කුමරු විවාහකරගැනීම නිසා පෘතුගීසීහු දායාද වශයෙන් ඉංග්‍රීසින්ට පැවරූ බොම්බාය ප්‍රදේශය දැක්වෙන අක්ෂරය කුමක් ද?

2. **B** අක්ෂරයෙන් දැක්වෙන්නේ පෘතුගීසීන්ගේ පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානයයි. එය හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 4යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **ඔබ විසින් තෝරාගත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

**2.** (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ පහත සඳහන් ජාතීන්ගේ **මව් රටවල්** නම් කරන්න.

a) - පෘතුගීසින්

b) - ලන්දේසින් (ලකුණු 02 යි)

(ii) දෙවන විමලධර්මසූරිය රජු හා ලන්දේසින් ඉතා සුහදශීලීව කටයුතු කර ඇත. එය සනාථ කළහැකි උදාහරණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ලන්දේසින්ගේ පාලන සමයේ අධිකරණ කටයුතු සිදුවූ ප්‍රධාන උසාවි වර්ග **දෙකක්** නම්කර ඒවාගෙන් සිදුවූ කාර්යයන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**3.** (i) ඉංග්‍රීසින් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු **A, B, C** හා **D** **අනු පිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

**A-** කිව් ලිපිය ලියූ පුද්ගලයා කවුරුන් ද?

**B-** ඉංග්‍රීසින් විසින් අල්ලා ගන්නා ලද ත්‍රිකුණාමලයේ පිහිටි **ලන්දේසි බලකොටුව** නම් කරන්න.

**C-** ක්‍රි.ව 1797 වර්ෂයේ දී මුහුදුබඩ ප්‍රදේශයේ සිදුවූ බ්‍රිතාන්‍ය විරෝධි කැරැල්ලට හේතු සොයා බැලීමට පත්කළ **කොමිසම** කුමක් ද?

**D-** ශ්‍රී වික්‍රම රාජසිංහ රජු උඩරට රජවීමට පෙර හැඳින්වූ **නම** ලියන්න. (ලකුණු 04 යි)

(iii) උඩරට රාජධානිය ඉංග්‍රීසින්ට යටත්වීමට බලපෑ හේතු **දෙකක්** නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) ක්‍රි.ව 1818 නිදහස් සටනට නායකත්වය දුන් පුද්ගලයන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ක්‍රි.ව 1848 සටන ඇති වීමට බලපෑ **කෝල්බෲක් ප්‍රතිසංස්කරණ දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව 1848 සටන අසාර්ථක වීමට **බලපෑ හේතු දෙකක්** නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**5.** (i) බ්‍රිතාන්‍ය ජාතිකයන් මෙරටට වතු වගාව හඳුන්වා දීමට පෙර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල ප්‍රධාන අංශ 03ක් තිබුණි. ඉන් අංශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත ප්‍රශ්නවලට පිළිතුරු **A, B, C** හා **D** **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

**A -** උඩරට පැවති ආර්ථිකය තුළ රජයට අවශ්‍ය ශ්‍රමය ලබාගැනීමට භාවිත වූ **ක්‍රමය** නම් කරන්න.

**B -** සිංකෝනා නමැති පැළෑටිය යොදාගෙන නිපද වූ **ඖෂධ වර්ගය** කුමක් ද?

**C -** ශ්‍රී ලංකාවේ **පළමු තේ වත්ත** නම් කරන්න.

**D -** ශ්‍රී ලංකාවේ පොල් පර්යේෂණ ආයතනය පිහිටි **ප්‍රදේශය** කුමක් ද? (ලකුණු 04 යි)

(iii) (a) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ලංකාවේ කෘෂිකර්ම කටයුතු දියුණු කිරීම සඳහා ඉංග්‍රීසින්ගේ අවධානය යොමු වීමට බලපෑ **හේතු දෙකක්** නම් කරන්න.

(b) ඔවුන් ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න. (ලකුණු 05 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**6.** (i) ක්‍රි.ව. 1857 වසරේදී ඇති වූ **''සිපොයි'' කැරැල්ලේ දී,**

(a) ඉංග්‍රීසි හමුදා නිලධාරියකුට වෙඩිතැබූ සිපොයි භටයා නම් කරන්න.

(b) සිපොයි භටයන් විසින් ඉන්දියාවේ අධිරාජයා ලෙස ප්‍රකාශ කළ මූගල් පාලකයා කවුරුන් ද?

(ලකුණු 02 යි)

(ii) ප්‍රංශ ජාතිකයන් හා ඉංග්‍රීසි ජාතිකයන් ඉන්දියාවේ පිහිටුවාගත් බලකොටු දෙක බැගින් නම් කරන්න.

(a) ප්‍රංශ ජාතිකයන්

(b) ඉංග්‍රීසි ජාතිකයන් (ලකුණු 04 යි)

(iii) ඉන්දියානු නිදහස් ව්‍යාපාරය සඳහා මහත්මා ගාන්ධි මහත්මා හඳුන්වා දුන් අවිහිංසාවාදී සටන් උපක්‍රම දෙකක් නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)


**7.** පහත සඳහන් උපකාරක පද යොදාගෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

**හරහට**

1. ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයෙකි.
2. 1848 වසරේ බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් බදු වර්ගයකි.
3. ඉංග්‍රීසින් ඉන්දියාවේ බලය අල්ලා ගැනීමට අනුගමනය කළ උපාය මාර්ගයකි.
4. පංචමහා වාදවලින් එකකි.
5. ලන්දේසින් විසින් ලංකාවේ කුරුඳු වගාකළ ප්‍රදේශයක් වේ.
6. 1848 කැරැල්ලේ නායකයෙකි.

**පහළට**

1. මිෂනාරි වරුන් විසින් මුද්‍රණය කර බෙදාහරින ලද ප්‍රකාශනයකි.
2. 1833 දී අධිකරණ ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්නේ මොහු ය.
3. ශ්‍රී වික්‍රමරාජසිංහ රජුගේ අගමෙහෙසිය ඇයයි.
4. ලන්දේසින් විසින් ''පඩිපෙළ'', මෙසේ හඳුන්වන ලදි.
5. පුනරුද සමයේ ආරම්භ කරන ලද හින්දු පුවත්පතකි.




(ලකුණු 11 යි)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## ඉතිහාසය

පිළිතුරු පත්‍රය

### I කොටස

01. 3
02. 4
03. 3
04. 4
05. 2
06. මුඩුබිම්
07. රොබට් ඇන්ඩෘස්
08. ජෝර්ජ් බර්ඩ්
09. පරමධම්මචේතිය
10. දඩාබායි නඖරෝජි
11. ( ✗ )
12. ( ✓ )
13. ( ✓ )
14. ( ✗ )
15. ( ✗ )
16. ලිස්බන්
17. වලිසිංහ හරිස්චන්ද්‍ර
18. ඔරාබි පාෂා
19. ඩී. එස්. සේනානායක
20. ෂා ජහන්

### II
### I කොටස

**1.**

(i) 1. පළමුවන විමලධර්මසූරිය රජතුමා
2. මහනුවර 3. ස්පිල්බර්ජන් 4. ලන්දේසි / ඕලන්ද

(ii) 1. ඕල්කට් තුමා 2. ඇමරිකාවේ සිට 3. කොළඹ පරමවිඥානාර්ථ
4. ආනන්ද, මහනුවර ධර්මරාජ, ගාල්ලේ මහින්ද, නාවලපිටියේ අනුරුද්ධ, කොළඹ මියුසියස්, මාතලේ විජය

(iii) 1. මඩකළපුව 2. C (iv.) 1. A 2. ගෝව

**2.** i. a පෘතුගාලය b ඕලන්දය

ii. ⋆ පහළ බුරුමයෙන් උපසම්පදා භික්ෂූන් ගෙන්වා ගැනීමට ලන්දේසි නැව් ලබා දීම
⋆ පිටිගල් කෝරලයේ කුරුඳු තැලීමට ලන්දේසීන්ට පනවා තිබූ තහනම ඉවත් කිරීම
⋆ රජුගේ කුරුඳු, පුවක්, ඇතුන් වෙළෙඳ සමාගම විසින් මිල දී ගැනීමට එකඟවීම

iii. ⋆ රාද් වැන් ජස්ටිට් (මහාධිකරණය) - ඉහළම උසාවිය, ප්‍රධානියා හුෆ්ට් අද්මිනිස්කාර්, ප්‍රධාන කාර්ය අපරාධ නඩු විසඳීම.
⋆ සිවිල්රාද් (සිවිල් උසාවිය) - රික්ස් ඩොලර් 120 අඩු අලාභ සම්බන්ධ සිවිල් නඩු විසඳීම, විවාහ සම්බන්ධ නඩු විසඳීම.
⋆ ලැන් රෑද් (ඉඩම් උසාවි) - දිසාවේ වරයා ප්‍රධානියා වීම. සරල වියදම් අඩු උසාවි ක්‍රමයයකි.
⋆ පිස්කල් උසාවි

**3.** (i) ⋆ පිහිටීමේ වැදගත්කම ⋆ වෙළෙඳ කටයුතු වලදී ඇති වැදගත්කම ⋆ ත්‍රිකුණාමල වරායේ වැදගත්කම

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ii) A- පස්වන විලියම් (ඔරේන්ජ්හි පස්වන විලියම්)

B- පෙඩ්රික් කොටුව C- ද මියුරන් කොම්සම D- කන්නසාමි

(iii) ★ රජු හා රදළ ප්‍රධානින් අතර ඇති වූ අර්බුද
★ රජු හා භික්ෂූන්වහන්සේලා අතර ඇති වූ අර්බුද
★ රදළ ප්‍රධානින් අතර ඇති වූ අර්බුද
★ රජු හා සාමාන්‍ය ජනතාව අතර ඇතිවූ අර්බුද
★ ඉංග්‍රීසින්ගේ උපක්‍රමශීලී ක්‍රියා

**4.** (i) කැප්පෙටිපොල, මඩුගල්ලේ, කිවුලේගෙදර මොහොට්ටාල, පිළිමතලාවේ දෙවන අධිකරම්, බූටෑවේ රටේ රාල , කොහුකුඹුරේ රාල

(ii) ★ උඩරට ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
★ වතුවගාව හඳුන්වා දීම නිසා දේශීය කෘෂිකර්මාන්තය බිඳ වැටීම
★ ගම් සභාව අහෝසි කිරීම නිසා ග්‍රාමීය පොදු කටයුතු බිඳ වැටීම
★ රජය හා මහජනතාව අතර සබඳතාව බිඳ වැටීම
★ බුදු දහම නොසලකා හැරීම

(iii) ★ කැරැල්ල ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වීම
★ මාර්ෂල්ලෝ හෙවත් යුධ නීතිය පැනවීම
★ සටනේ නායකයින් අත් අඩංගුවට ගැනීම

**5.** (i) ගොඩ ගොවිතැන, මඩ ගොවිතැන, සත්ව පාලනය

(ii) A- රාජකාරි සේවා ශ්‍රම ක්‍රමය B- ක්විනින් C- ලූලු කඳුර D- ලුණුවිල

(iii) a- ★ පළමු ලෝක සංග්‍රාමය නිසා ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමේ ගැටලු ඇතිවීම
★ වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂපාදනය වැඩි කළ යුතුවීම
b- ★ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම
★ වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම
★ සමූපකාර සමිති පිහිටුවීම

**6.** (i) a - මංගල් පාණ්ඩේ b - බහදූර් ෂා

(ii) a - පෙන්ඩිචෙරි, කරිකාල්, චන්ද්‍ර නගර් b - මද්‍රාසි, බොම්බාය, කල්කටා

(iii) 1) සත්‍යග්‍රහ පැවැත්වීම 2) රජයට සහය නොදැක්වීම

3) විරෝධතා පා ගමන් 4) සිවිල් නීති කඩ කිරීම

**7.**

| **හරහට** | **පහළට** |
|---|---|
| 1. ටොරින්ටන් | 1. උරගල |
| 2. මුද්දර | 2. කැමරන් |
| 3. උපකාරක ගිවිසුම් | 3. රංගම්මා |
| 4. ගම්පොළ | 4. තරප්පු |
| 5. මාතර | 5. ඉන්දු සාදනම් |
| 6. පුරන් අප්පු | |